සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2020

10 ශ්‍රේණිය **කතෝලික ධර්මය I** කාලය පැය 1 යි

නම/ විභාග අංකයඃ

- සියලුම ප්‍රශ්නවලට උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමිවේ.
- 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

01. හිතෝපදේශ, ධර්මදේශකය ග්‍රන්ථ අයත් වනුයේ,
    (1) පංච පුස්තකයටය. (2) ප්‍රඥා සාහිත්‍යටය.
    (3) ඉතිහාස පොත්වලටය. (4) දිවැසිවර ග්‍රන්ථවලටය.

02. ඊශ්‍රායෙල් ජනතාවගේ අත්දැකීම් අර්ථකථනය කළ යුත්තේ,
    (1) දේව භක්තියෙනි. (2) විශ්වාසයේ ඇසිනි.
    (3) දසපනත තුළිනි. (4) මතු බලාපොරොත්තුවෙනි.

03. බබිලෝනි විප්‍රවාසයෙන් පසු ලියූ එස්රා හා නෙහෙමියා කෘතිවල මූලිකව සඳහන් වන්නේ,
    (1) ජුදා ජාතියේ සමාජීය හා ආගමික ප්‍රතිස්ථාපනය යි.
    (2) දස පනත ලබා දීම පිළිබඳ කෙරෙන විග්‍රහය යි.
    (3) ගිවිසුම් ජීවිතයට පිටුපෑම නිසා වන විපාක යි.
    (4) රතු මුහුදෙන් එතෙර වී පොරොන්දු දේශයට ඇතුළු වීමේ සිද්ධිය යි.

04. ශුද්ධ වූ සභා මාතාව විසින් ''ජීවන සභා සම්ප්‍රදාය'' ඔස්සේ අපට දානය කරන්නේ,
    (1) පේදුරු තුමා කළ කී දේය. (2) ජුවාම් තුමා කළ කී දේය.
    (3) දෙවියන් වහන්සේ කළ කී දේය. (4) ජේසුස් වහන්සේ කළ කී දේය.

05. ජීවන සභා සම්ප්‍රදාය පෝෂණය වී ඇත්තේ,
    (1) ශුද්ධාත්මයාණන්ගේ ආලෝකය තුළය.
    (2) පරම්පරාවෙන් පරම්පරාවට දායාද වීම තුළය.
    (3) නික්මයාම හෙවත් ඒකරාශී වීම තුළය.
    (4) ආදී මව්පියන්ගෙන් ලද ආභාෂය තුළය.

06. ''දෙවියන් වහන්සේගේ මිත්‍රයා'' යන්නෙන් අරුත් ගන්වන්නේ,
    (1) මතෙව්ස් ය. (2) තියෝපිලස් ය. (3) නෙසුවා ය. (4) ක්‍රිස්ටෝස් ය.

07. කිතුණු සංඝයන් පෞද්ගලිකව හමුවිය නොහැකි නිසා විශ්වාසයේ ස්ථිරත්වය සඳහා ලිපි රචනා කළේ,
    (1) ශුද්ධ වූ මතෙව්තුමා ය. (2) ශුද්ධ වූ මාක්තුමා ය.
    (3) ශුද්ධ වූ පාවුලුතුමා ය. (4) ශුද්ධ වූ ලූක්තුමා ය.

08. ද්විතීය පාවුලු සංදේශ වන්නේ,
    (1) ගලාති / පිලිප්පි / 2 තිමෝති ය.
    (2) ගලාති / පිලිමොන් / 1 තෙසලෝනික ය.
    (3) එපීස හා පිලමොන් / 1 තිමෝති ය.
    (4) එපීස / කොලොස්සි / 2 තෙසලෝනික ය.



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

09. උත්තම පූජක මැදුර දක්වා ජේසුතුමා පසුපසින් ගමන් කළේ,

(1) පාවුලුතුමා ය. (2) ජුවාම්තුමා ය. (3) ජාකොබ්තුමා ය. (4) පේදුරුතුමා ය.

10. අරමතියාවේ ජෝශප් ජේසුගේ ශරීරය භූමදානය සඳහා අවසර ගනු ලැබුවේ,

(1) හෙරෝත්ගෙනි. (2) පිලාත්ගෙනි.

(3) නායක පූජකයන්ගෙනි. (4) ආණ්ඩුකාර ඇන්ටිපස්ගෙනි.

11. එම්මාවුස් ගමනේ දී ගෝලයන් දෙදෙනා ජේසුස් වහන්සේ හඳුනාගත්තේ,

(1) රොටි ආශිර්වාද කර පූප කඩන විට ය. (2) ජෙරුසලමේ සිට ගමන් කරන විට ය.

(3) ගමනාන්තයේ දී වෙන්වන විට ය. (4) ශු. ලියවිල්ල පහදා දෙන විට ය.

12. ජේසුස් වහන්සේ තෝමස්ගේ අවිශ්වාසය දුරුකළ විට ඔහු කළ ප්‍රකාශය වූයේ,

(1) මාගේ ආත්මය බාර කරමි යි.

(2) මාගේ ස්වාමීනි මාගේ දෙවියනි ය.

(3) මම ඔබට ප්‍රේම කරන බව දනිමි ය.

(4) මාගේ බැටළුවන් පෝෂණය කරන්න ය.

13. ''නව අහස හා නව පොළොවට ඇතුළු වීම නම්,

(1) යාච්ඤාවත්, ප්‍රසාද නිධාන ලැබීමත් අවැසි වේ.

(2) නිතර භක්ති අභ්‍යාසවලට සහභාගී වීම ප්‍රමාණවත් වේ.

(3) දිනපතා පුද පූජා කිරීම යෝග්‍ය වේ.

(4) බාරහාර වීමත් ගොඩමස් වැළකීමත් සුදුසු වේ.

14. පාස්කුවෙන් පසු ජුදා ආගමිකයින්ගේ ප්‍රධාන මංගල්‍යය වූයේ,

(1) පාස්කු මංගල්‍යය හෙවත් ඉරුදින මංගල්‍යය යි.

(2) නැඹුල් එල මංගල්‍යය හෙවත් අස්වනු නෙලීමේ මංගල්‍යය යි.

(3) පනත යන අරුත ඇති පෙන්තකොස්ත මංගල්‍යය යි.

(4) එතෙරවීම හෙවත් පාස්කු මංගල්‍යය යි.

15. ''සැඩ සුළඟක් හමන්නාක් වැනි හඬක් හදිස්සියේ පැමිණියේ ය.'' මෙම ප්‍රකාශය සඳහන් වන්නේ,

(1) ජොහාන් 17 / 1-8 (2) ක්‍රියා 2: 1-8

(3) හෙබ්‍රෙව් 4: 1-8 (4) පිලිප්පි 5: 11-18

16. විජාතික කොරන්ලියස් ඇතුලු පවුලේ සැමට සුබ අස්න දේශනා කළේ,

(1) ශු. ජාකොබ්තුමා ය. (2) ශු. පාවුලුතුමා ය. (3) ශු. පේදුරුතුමා ය. (4) ශුජොහාන්තුමා ය.

17. දේව සේවය වෙනුවෙන් කැප වූ තාර්සස් හි උපත ලැබූ ශුද්ධ වූ පාවුලුතුමා,

(1) ගලීල වැසියෙකි. (2) අන්තියෝක වැසියෙකි.

(3) ජුදා පුරවැසියෙකි. (4) රෝම පුරවැසියෙකි.

18. ශුද්ධ වූ පාවුලුතුමා, තිමෝතියස්, ලූක්තුමා හා එක් වූයේ,

(1) පළමු ධර්මදූත චාරිකාව සඳහා ය. (2) දෙවන ධර්මදූත චාරිකාව සඳහා ය.

(3) තෙවන ධර්මදූත චාරිකාව සඳහා ය. (4) රෝම චාරිකා සඳහා ය.

19. ක්‍රි. ව. 68 දී ශුද්ධ වූ පාවුලුතුමා පීඩාවන් හා අභියෝගයන්ට මුහුණු දී හිස ගසා මරා දමනු ලැබුවේ,

(1) අවුරේලියස්ගේ පීඩනයේ දී ය. (2) සෙප්ටිමස් සෙවරස් පීඩනයේ දී ය.

(3) නීරෝ පීඩනයේ දී ය. (4) ට්‍රාජන්ගේ පීඩනයේ දී ය.

20. ''එහෙත් ඔබ කියන සේක් නම්, දැල හෙළමියි.'' කියමින් ජේසුගේ අණට කීකරු වූයේ,

(1) ජොහාන් හා පේදුරු ය. (2) ඇන්ඩෘ හා ජාකොබ් ය.

(3) ඇන්ඩෘ හා ජෝශප් ය. (4) පේදුරු හා ඇන්ඩෘ ය.

21. පේදුරුතුමාගේ මහ ප්‍රකාශය සිදු කළේ,

(1) පිලිප්පි කයිසාරියේ දී ය. (2) සිරියාවේ අන්තියෝකයේදී ය.

(3) පිසිදියේ අන්තියෝකයේ දී ය. (4) ග්‍රීසියේ අන්නායාවල දී ය.

22. ක්‍රිස්තුන් වහන්සේ මෙලොවින් සමුගැනීමට පෙර සදහටම අප සමග සිටිනු සඳහා දෙනු ලැබූ තිළිණයකි,

(1) සාමය. (2) දිව්‍ය සත්ප්‍රසාදය. (3) දස පනත. (4) භාග්‍ය අට.

23. යමක් හෝ යමෙක් දෙවියන් වහන්සේට ඇති සම්බන්ධතාවය මත ................................ වේ.

මෙහි හිස්තැනට යෝග්‍ය යෙදුම පහත වරණ ඇසුරෙන් තෝරන්න.

(1) ඒකත්වය. (2) කතෝලික (3) ශුද්ධවන්ත (4) අපෝස්තලික

24. A - අති උතුම් වැලන්ස් මෙන්ඩිස් රදගුරු හිමිපාණන්

B - අති උතුම් ජෝශප් වියානි රදගුරු හිමිපාණන්

C - අති උතුම් හැරල්ඩ් ඇන්තනී හිමිපාණන්

D - අති උතුම් රේමන් වික්‍රමසිංහ හිමිපාණන්

ඉහත රදගුරු පදවි අතරින් කුරුණෑගල හා හලාවත පදවි හිමිපාණන් පහත වරණ අතරින් තෝරන්න.

(1) A හා B (2) A හා C (3) B හා C (4) C හා D

25. ක්‍රිස්තුවර්ෂ 1687 දී ලක්දිව කිතුනුවන් මුදා ගැනීමට දෙවියන් වහන්සේ විසින් එවන ලද ගැලවුම්කරුවා වූයේ,

(1) ශුද්ධ වූ ජුසේවාස් මුනිතුමා ය.

(2) ගෞරවනීය ගොන්සාල්වෙස් පියතුමා ය.

(3) මැක්ෂිමිලියන් කොල්බේ පියතුමා ය.

(4) ශුද්ධ වූ ජුසේතුමා ය.

26. මුල් කිතුණු සංඝය තුළ ප්‍රේමය හා සේවය අතපසු කරමින් දිව්‍ය සත්ප්‍රසාද භෝජනයට සහභාගීවීම නුසුදුසු බව ශුද්ධ වූ පාවුලුතුමා අවධාරණය කරන්නේ,

(1) කොරෙන්ති සභාවට ය. (2) ගලාති සභාවට ය.

(3) එපීස සභාවට ය. (4) පිලිප්පි සභාවට ය.

27. දිව්‍ය සත්ප්‍රසාදය ලබා ගැනීම යෝග්‍ය නොවන අවස්ථාවක් වන්නේ,

(1) අන්‍ය ආගම්වලට ගරු කළ විට ය. (2) ශාරීරික පුන්‍ය ක්‍රියාවක් කළ විට ය.

(3) මරණීය පාපයක් කළ විට ය. (4) එක්වරු ශීලය රක්‍ෂා නොකළ විට ය.

28. දිව්‍ය පූජාවේ යථාර්ථය වන ප්‍රේමය හා සේවය ක්‍රියාවට නංවමින් දිව්‍ය පූජාව අර්ථවත් කර ගැනීමට කිතුණු සංඝයට ආරාධනා කරන්නේ,

(1) ශු. පාවුලුතුමා ය. (2) ශු. ජොහාන්තුමා ය.

(3) ශු. ලූක්තුමා ය. (4) ශු. ජාකොබ්තුමා ය.

29. පුරාණ ගිවිසුමේ වන්දනාවේ කේන්ද්‍රීය ක්‍රියාව වන්නේ,

(1) කළ පාපවලට මනස්ථාපනය වීම. (2) පුදසුන මත ලේ ඉසීමය.

(3) සතුන් දෙපළු කිරීම ය. (4) යාග පූජා කිරීම ය.

30. නව ජීවිතයකට උත්ථාන වෙමින් කල්වාරි යාගයට සම්බන්ධ වීමට නම්,

(1) ක්‍රිස්තුන් වහන්සේ තුළ පාපයට මැරිය යුතුයි.

(2) හැකි තරම් වන්දනා ගමන් යා යුතුයි.

(3) භක්ති අභ්‍යාස වලට සහභාගි විය යුතුයි.

(4) නික්මයාමේ සිද්ධිය අනුසාර කළ යුතුයි.

31. A - විශ්ව ලේඛන 14 රචනා කිරීම.

B - 1907 කොන්වෙන්ෂුවල් ප්‍රැන්සිස් නිකායට ඇතුළු වීම.

C - බලාපොරොත්තුවේ එළිපත්ත කෘතිය රචනා කිරීම.

D - පැරිස් විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය ධූරය දැරීම.

ඉහත කරුණු ඇසුරෙන් දෙවන ජුවාම් පාප්වහන්සේ පිළිබඳ නිවැරදි වරණ තෝරන්න.

(1) A හා B (2) A හා C (3) B හා C (4) C හා D

32. ශුද්ධ වූ තෙරේසා මව්තුමිය උපත ලද්දේ,

(1) ඉන්දියාවේ ය. (2) කල්කටාවේ ය. (3) ඇල්බිනියාවේ ය. (4) පෝලන්තයේ ය.

33. ප්‍රේමයෙන් අනාවරණය වන දෙවියන් වහන්සේ අපගේ,

(1) මාවතට එළිය වේ. (2) ඉරණමේ අගය වේ.

(3) දයාවේ පඬුර වේ. (4) විශ්වාසයේ මූලාශ්‍රය වේ.

34. ''මම පූජාවට වඩා කරුණාවට කැමැත්තෙමි.'' දවන යාග පූජාවලට වඩා දෙවියන් වහන්සේ පිළිබඳ අවබෝධයට කැමැත්තෙමි.'' මෙසේ සඳහන් ග්‍රන්ථය වන්නේ,

(1) හොසියා (2) මීකා (3) ශෙපනියා (4) මලාකි

35. දෙවියන් වහන්සේට බාරහාර හා පොරොන්දු ඉටු කිරීම,

(1) බලාපොරොත්තුවේ සීමා මායිම් ඉටු වීමකි.

(2) ගෞරවරයේ හා ප්‍රේමයේ සලකුණකි.

(3) දයාවේ හා ආදරයේ පිළිබිඹුවකි.

(4) ආදරයෙන් හඬගසන දෙවියන්ට පිළිතුරු දීමකි.

36. ඉරුදින ශුද්ධවත් ලෙස ගත කිරීම සඳහා පළමු ව අප කළ යුතු ණය යුක්තිය වන්නේ,

(1) පඬුරු පිදීමට සහභාගී වීම. (2) දිව්‍ය පූජාවට සහභාගී වීම.

(3) එක්වරු ශීලය ආරක්ෂා කිරීම. (4) පාප උච්චාරණය කිරීම.

37. අන් අය වෙනුවෙන් අඛණ්ඩ හා ගැඹුරු ලෙස කැපවීමට හා වැයවීමට හැකියාව හා කැමැත්ත අපට ලැබෙනුයේ,

(1) ප්‍රේමය නිසා ය. (2) ආශාව නිසා ය. (3) අත්දැකීම් නිසා ය. (4) අනුබලය නිසා ය.

38. සියළු පවුල් වලට පරමාදර්ශයය.

(1) පුංචි පවුල ය. (2) මිසම් පවුල ය. (3) ආදර්ශමත් පවුල ය. (4) ශුද්ධ වූ පවුල ය.

39. පිළිසිඳගත් මොහොතේ සිට ජීවිතය දෙවියන් වහන්සේට අයිති නිසා,

(1) අපි නිතර යාච්ඤා කිරීම උචිත වේ.

(2) ගබ්සාව බරපතල පාපයක් බව වටහාගත යුතුවේ.

(3) එක්වරු ශීලය ආරක්ෂා කළ යුතු වේ.

(4) දරුවන් හදා වඩා ගැනීම යෝග්‍ය වේ.

40. ප්‍රසාද ස්නාපනය ලැබූ සියල්ලන් ම කැඳවා ඇත්තේ,

(1) ජීවනය සඳහාය. (2) ගමනාන්තය සඳහාය.

(3) මයඝිදාවය සඳහාය. (4) සාමයේ උදාව සඳහාය.

*සියලුම හිමිකම් ඇවිරිණි*
*All Rights Reserved*

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2020

**10 ශ්‍රේණිය** **කතෝලික ධර්මය II** **කාලය පැය 2 යි**

| නම/ විභාග අංකයඃ |
|---|

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

---

01. (i) ද්විතීය පාවුළු සංදේශ දෙකක් නම් කරන්න.

(ii) ප්‍රඥා සාහිත්‍යයට අයත් ග්‍රන්ථ දෙකක් නම් කරන්න.

(iii) උපස්ථායකයින් සතු ගුණාංග දෙකක් නම් කරන්න.

(iv) ජේසුස් වහන්සේ පේදුරුතුමාට පැවරූ තුන් ප්‍රකාර කාර්යභාර දෙකක් නම් කරන්න.

(v) බ්‍රිතාන්‍ය යුගය තුළ මෙරට සේවය සඳහා පැමිණි ධර්මදූත කණ්ඩායම් දෙකක් නම් කරන්න.

(vi) ඊශ්‍රාලයේ ප්‍රධාන පූජා කොටස් දෙක නම් කරන්න.

(vii) දිව්‍ය පූජා යාගය සිදු කිරීමේ ප්‍රධාන අරමුණු දෙකක් සඳහන් කරන්න.

(viii) ජනවන්දනාවේ ප්‍රධාන අංග දෙකක් නම් කරන්න.

(ix) සාමාන්‍ය සමය තුළ සමරන වැදගත් මංගල්‍යය දෙකක් නම් කරන්න.

(x) කතෝලික සභාව පිළිගත් සභා දෙකක් නම් කරන්න.

02. (i) දේව අනාවරණයේ මූලාශ්‍ර 02 නම් කරන්න.

(ii) පුරාණ ගිවිසුමේ පොත් වර්ගීකරණයට අනුව පහත සඳහන් පොත් අඩංගු කාණ්ඩ නම් කරන්න.

1. ද්විතීය නීති සංග්‍රහය. 2. ජුදිත් 3. ධර්මදේශකයා

(iii) කොවිඩ් වසංගත තත්වය හමුවේ කිතුණුවෙකු ලෙස ඔබගේ ජීවිතයට ශුද්ධ බයිබලය වැදගත් වන ආකාරය කරුණු 05 ක් ඇසුරින් සඳහන් කරන්න.

03. (i) අපොස්තුළුවරුන්ගේ ක්‍රියාපොත ලියූ කතුවරයා සහ කාල වකවානුව නම් කරන්න.

(ii) අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතේ සැකැස්මේ අඩංගු කරුණු 03 ක් නම් කරන්න.

(iii) මිනිස්කම වියැකී යන සමාජ රටාවක් තුළ ශුද්ධ වූ පාවුලු තුමාගේ ආදර්ශයන් 05 ක් විස්තර කරන්න.



*මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.*

04. (i) පෙන්තකොස්ත දින පේදුරුතුමාගේ දේශනාව නිසා සිදු වූ ප්‍රතිඵල දෙකක් සඳහන් කරන්න.

(ii) ක්‍රියා 2 / 42 - 47 ට අනුව, මුල් කිතුණු සභාවේ ලක්ෂණ 03ක් නම් කරන්න.

(iii) ශුද්ධාත්මයාණන්ගෙන් සන්නද්ධ වූ පරිනත කිතුණුවකු ලෙස ශුද්ධ සභාව වෙනුවෙන් ඔබට කළ හැකි කාර්යයන් පහක් සඳහන් කරන්න.

05. (i) පාද සේදීමේ ක්‍රියාව තුළ ජේසුස් වහන්සේ පෙන්වා දුන් ප්‍රේමයේ ආඥාව නම් කරන්න.

(ii) ජුදා පාස්කු භෝජනයේ මූලිකාංග 03ක් සඳහන් කරන්න.

(iii) ක්‍රිස්තුන් වහන්සේ අපොස්තුළුවරුන්ගේ පාද දෝවනය කිරීම තුළින් ඔබගේ ජීවිතයට ගත හැකි ආදර්ශ පහක් ගෙනහැර දක්වන්න.

06. (i) බලාපොරොත්තුවට විරුද්ධ පාපයන් 02ක් නම් කරන්න.

(ii) කතෝලික සභා ධර්මොපදේශයට අනුව, දේව ප්‍රේමයට විරුද්ධ පාපයන් 03ක් සඳහන් කරන්න.

(iii) දේව නාමය ගෞරවයෙන් භාවිත කළ යුතු බව උගන්වන පනතට විරුද්ධ ක්‍රියා පහක් සඳහන් කරන්න.

07. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

(i) ආගමන සමය.

(ii) නත්තල් සමය.

(iii) චතාරික සමය.

(iv) පාස්කු සමය.

## පිළිතුරු පත්‍රය - I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. ( 3 ) | 02. ( 2 ) | 03. ( 1 ) | 04. ( 4 ) | 05. ( 1 ) | 06. ( 2 ) | 07. ( 3 ) | 08. ( 4 ) | 09. ( 4 ) | 10. ( 2 ) |
| 11. ( 1 ) | 12. ( 2 ) | 13. ( 1 ) | 14. ( 3 ) | 15. ( 2 ) | 16. ( 3 ) | 17. ( 4 ) | 18. ( 2 ) | 19. ( 3 ) | 20. ( 4 ) |
| 21. ( 1 ) | 22. ( 2 ) | 23. ( 3 ) | 24. ( 2 ) | 25. ( 1 ) | 26. ( 1 ) | 27. ( 3 ) | 28. ( 2 ) | 29. ( 4 ) | 30. ( 1 ) |
| 31. ( 2 ) | 32. ( 3 ) | 33. ( 4 ) | 34. ( 1 ) | 35. ( 2 ) | 36. ( 2 ) | 37. ( 1 ) | 38. ( 4 ) | 39. ( 3 ) | 40. ( 3 ) |

(ල. 40)

## II පත්‍රය

01. (i) එපීස /කොලොස්සි / 2 තෙසලෝනික

(ii) ජෝබ් / ගීතාවලිය / හිතෝපදේශය / ධර්මදේශකයා / ප්‍රේම ගී / ප්‍රඥාව / සිරාක් හෙවත් උපදේශකයා

(iii) යහපත් දිවි පෙවෙතක් ගත කිරීම / ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වීම / ප්‍රඥාවෙන් පූර්ණ වීම

(iv) ''මාගේ බැටළු පැටවුන් පෝෂණය කරන්න''
''මාගේ බැටළුවන්ගේ එඬේරා වන්න''
''මාගේ බැටළුවන් පෝෂණය කරන්න''

(v) සිල්වෙස්ත්‍රෝ බෙනදික්ත නිකාය / නිර්මල මරිය නිකාය / ජේසු නිකාය / ද ලාසාල් සොහොයුරන්ගේ පැවිදි නිකාය / මාරිස්ට් සොහොයුරන්ගේ පැවිදි නිකාය / ශු. පවුලේ කන්‍යා සොහොයුරියන්ගේ පැවිදි නිකාය.

(vi) දවන පූජා / නොදවන පූජා

(vii) දෙවියන් වහන්සේට නමස්කාර කිරීම / දෙවියන් වහන්සේට තුති පිදීම / පාපයට වන්දි ගෙවීම / ආත්මික හා ශාරීරික අවශ්‍යතා ඉල්ලා ගැනීම

(viii) දිව්‍ය පූජාව / දේව ප්‍රසාද නිධාන / යාම යැදුම

(ix) ශුද්ධ වූ ත්‍රීත්වයේ මංගලෝත්සවය / දිව්‍ය සත්ප්‍රසාද මංගලෝත්සවය / මළවුන් සිහිපත් කරන දිනය / ක්‍රිස්තු රාජාණන්ගේ මංගලෝත්සවය / ශ්‍රී ලංකා අප ස්වාමිදූගේ මංගලෝත්සවය

(x) ශ්‍රී ලංකා සභාව (එංගලන්ත සභාව, ඇංග්ලිකන් සභාව) / බැප්ටිස්ට් සභාව / ඕලන්ද රෙපරමාදු සභාව (ක්‍රිස්තියානි රෙපරමාදු සභාව) / ප්‍රෙස්බිටේරියන් සභාව / දකුණු ඉන්දියානු සභාව / ග්‍රීක ඕතඩොක්ස් සභාව

02 (i)

(ii) ද්විතීය නීති - පංච පුස්තක ය
ජූදිත් - ඉතිහාස පොත්
ධර්මදේශකයා - ප්‍රඥා සාහිත්‍යය.

(iii) සිසුන් ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න.

03 (i) කතුවරයා - ලූක්තුමා
කාල වකවානුව - ක්‍රි. ව 80 - 90 අතර කාලය.

(ii) ධර්මදූත සේවයට සූදානම / ජෙරුසලමෙහි සාක්ෂි දැරීම / ශුද්ධ වූ පාවුලු තුමාගේ ධර්මදූත සේවය.

(iii) සිසුන් ලියා ඇති පිළිතුර අනුව ලකුණු ලබා දෙන්න.

04 (i) මනස්ථාප වී බෞතිස්මය ලැබූ පිරිස 3000 දක්වා වැඩි වීම / විජාතික කොර්නේලියස් ඇතුළු පවුලේ සැම කිතු දහම වැළඳ ගැනීම.

(ii) ප්‍රේරිතයන්ගේ ඉගැන්වීම / සහභාගිකම / රොටී කැඩීම / යාච්ඤාව

(iii) සිසුන් ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න.

05 (i) ''මා ඔබට ප්‍රේම කළාක්මෙන් ඔබත් එකිනෙකාට ප්‍රේම කරන්න.''

(ii) පාස්කු බැටළුවා / නුමුහුන් රොටි / තිත්ත පලා

(iii) සිසුන් ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබාදෙන්න.

06 (i) ඉච්ඡාබංගත්වය / අනුමානය

(ii) දේව ප්‍රේමයට ප්‍රතිචාර නොදක්වීම / දේව ආදරය පිළිබඳ මෙනෙහි නොකිරීම / දිව්‍ය වූ යහපතින් කෙනෙකු වලක්වාලීම / උඩගුවෙන් දෙවියන් වහන්සේ ප්‍රතික්ෂේප කිරීම

(iii) සිසුන් ලියා ඇති පිළිතුරුවලට අනුව ලකුණු ලබා දෙන්න.

07 (i) පිටු අංක 108

(ii) පිටු අංක 108

(iii) පිටු අංක 108 - 109

(iv) පිටු අංක 110